ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව - 2016
----------------------------------------------

ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධිත) පනතේ 9 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. කමිටුවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3** විගණකගේ වගකීම
--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීමට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. මෙම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කමිටුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කමිටුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** මූල්‍ය ප්‍රකාශන

**2.1** තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ **2.2** ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් **2016** දෙසැම්බර් **31** දිනට ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.2.1.** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ප්‍රමිතයේ පරිච්ඡේද **2** හි **2.52** වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ගිණුම්කරණ ප්‍රමිතිවලින් අවසර දී ඇති විටෙක හැර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වත්කම් හා වගකීම් හිළව් නොකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී පෞද්ගලික බැංකුවක පැවති රු.**1,214,489** ක් වූ අවාසිදායක බැංකු ශේෂය එම බැංකුවේ තවත් ගිණුමක වූ රු.**21,423,047** ක වාසිදායක බැංකු ශේෂයට හිළව්කර ශුද්ධ අගය රු. **20,208,558** ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

**2.2.2** ගිණුම්කරණ අඩුපාඩු

**2005** වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල තීන්දුවක් මගින්, රූඩ් **01** පර්චස් **20** ක් වූ ඉඩම ජාතික ඔලිම්පික් කමිටු ප්‍රධාන කාර්යාලයට පවරාදී තිබුණද එහි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3** විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන්වලට අදාළව ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | ගිණුම් අයිතමය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | ජාතික ඔලිම්පික් කමිටු උපසභාපතිගේ පෞද්ගලික මෝටර් රථය සඳහා 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ඉන්ධන සඳහා ලබා දුන් මුදල් | 367,801 | ඉන්ධන ලබා දීම සඳහා කමිටුවේ සභාපතිගේ අනුමැතිය |
| (ආ) | සභාපතිවරයාගේ ණය කාඩ් පතින් දරන ලද වියදම් | 75,922 | බිල්පත් හා වියදම් විස්තර |

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 19 වන වගන්තිය | අමාත්‍යවරයා විසින් ජාතික ඔලිම්පික් කමිටුවේ ක්‍රියාකාරීත්වය හා යුතුකම් පිළිබඳ නියෝග පැනවිය යුතු වුවද කමිටුවේ ක්‍රියාකාරීත්වය හා යුතුකම් සඳහා අත්‍යවශ්‍ය ගිණුම්කටයුතුභාවය, නිලවරණය වැනි කටයුතුවලට අදාළ නියෝග පනවා නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්ම වූ රු. 1,194,000 ක් වටිනා චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් අදාළ රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1645 (අ) | කමිටුව සතු වෑන් රථය සඳහා වාහන ලොග් පොතක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) 2009 ජුනි 09 දිනැති අංක ඩී.එම්.ඒ /2009 (1) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛයේ 03 ඡේදය | අමාත්‍යාංශයේ හෝ ජාතික ඔලිම්පික් කමිටුවේ අභ්‍යන්තර විගණන ඒකක මගින් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ මූල්‍ය ප්‍රතිඵලය රු. 3,740,138 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 11,054,453 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,794,591 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ වියදම රු.99,136,620 කින් වැඩිවී තිබුණද ආදායම රු.113,931,210 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ඔලිම්පික් ක්‍රියාකාරකම් සඳහා සත්කාරක රටවල්වලින් ගුවන් ටිකට් පත් වියදම් ඇතුළුව විදේශ ගමන් වියදම් සඳහා රු. 3,478,905 ක මුදලක් ලැබී තිබූ අතර ඊට අදාළ ගෙවීම් වශයෙන් රු. 6,829,253 ක මුදලක් වැයකර තිබුණි. ඒ අනුව ලද මුදල ඉක්මවා රු. 3,350,348 ක් කමිටුවේ අරමුදල් මගින් ගෙවීම් කර තිබුණි.

(ආ) ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව විසින් ව්‍යාපෘති ක්‍රියාකාරකම් 4 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු. 3,009,297 ක මුදලක් ලබා දී තිබූ අතර ඊට අදාළ ගෙවීම් වශයෙන් රු.3,918,126 ක මුදලක් වැයකර තිබුණි. ඒ අනුව ලද මුදල ඉක්මවා රු.908,829 ක මුදලක් කමිටුවේ අරමුදල් මගින් ගෙවීම් කර තිබුණි.

(ඇ) සාමාජික සංගම් අතර බෙදා දීම සඳහා ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවෙන් ලැබුණු මුදල්වලින් ක්‍රීඩා සංගම් 8 ක් සඳහා වෙන්කර තිබුණු එකතුව රු.1,766,469 ක් වර්ෂ දෙකක් ඉක්මවා තිබියදීත් අදාළ සංගම්වලින් ඉල්ලුම් නොකිරීම හේතුවෙන් කපාහැර තිබුණි.

### 4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------------

2013 වර්ෂය තුළ ශ්‍රී ලංකා ඔලිම්පික් කමිටුවේ 75 වන සංවත්සරයට සමගාමීව රු.5,200,000 ක මුදලකට "සමරු පොත්" 2000 ක් මුද්‍රණය කර සැපයීමේ කාර්යය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව පුද්ගලික ආයතනයක් තෝරාගෙන තිබුණු අතර ගිවිසුමකට එළඹීමකින් තොරව කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. එම කාර්යය සඳහා 2013 සැප්තැම්බර් 30 දින කොන්ත්‍රාත්තු වටිනාකමින් සියයට 50 ක්වූ රු. 2,600,000 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. මෙම වාර්තාවේ දින වන විටත් එම කාර්යය ඉටු කර ගෙන නොතිබූ අතර අත්තිකාරම් මුදල වූ රු. 2,600,000 අදාළ කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කමිටුවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) මූල්‍ය පාලනය | (i) දිගුකාලීනව ආයෝජනය කළ හැකි අතිරික්ත මුදල් කෙටිකාලීන ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර තිබීම.<br>(ii) විදේශ ගමන් වෙනුවෙන් වෙනත් රට වලින් ලැබෙන මුදල් ඉක්මවා වියදම් දරා තිබීම. |

| | | |
|---|---|---|
| (ආ) | ගිවිසුම් පාලනය | ගිවිසුම් අලුත් කිරීමකින් තොරව ආරක්ෂක සේවය ලබාගැනීම. |
| (ඇ) | ගිණුම්කරණය | පෙර වර්ෂයේ වැරදි මූල්‍ය ප්‍රකාශනවල අතීතානුයෝගී ලෙස නැවත ප්‍රකාශ කර නොතිබීම. |
| (ඈ) | අයවැය පාලනය | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ අයවැය ලේඛනයක් කමිටුව විසින් පවත්වා ගෙන ගොස් නොතිබීම. |